## තාවකාලික පදනම මත සනීපාරක්ෂක කම්කරු තනතුරට බඳවා ගැනීම
## ශ්‍රී ලංකා පොලීසිය ( ජනාධිපති ආරක්ෂක කොට්ඨාසය )

1.0 ජනාධිපති ආරක්ෂක කොට්ඨාසය සඳහා සනීපාරක්ෂක කම්කරු තනතුරු 50ක් සඳහා තාවකාලික පදනම මත වසරක කාලසීමාවක් සඳහා බඳවගැනීම් සිදුකිරීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

2.0 මෙම තනතුර තාවකාලික තනතුරක් වන අතර වසරක කාල සීමාවක් සඳහා බඳවා ගැනීම් සිදුකරනු ලැබේ. එම වසරක කාල සීමාව අවසන් වූ වහාම ඔබගේ තාවකාලික පත්වීම අහෝසි වේ. එමෙන්ම පැමිණීම, වැඩ සහ හැසිරීම සතුටුදායක නොවන බව පෙනී ගිය හොත් ඔබගේ සේවය අහෝසි කල හැකිය .

3.0 වැටුප :- වැඩ කරන දිනකට රු 641.40 ක දෛනික වැටුපක් හා එයට අතිරේකව රු 166.60 ක ගැලපීමේ දීමනාවක්ද හිමිවේ. එයට අමතරව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 37/2013 අනුව ජීවන වියදම් දීමනාවක්ද හිමිවේ.

4.0 බඳවා ගැනීමේ සුදුසු කම්.

අ. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

ආ. 2018.09.07 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

ඇ. යහපත් චරිතයකින් සහ මනා සෞඛ්‍යකින් යුක්ත විය යුතුය.

ඈ. අධ්‍යාපන සුදුසුකම්.

අ.පො.ස (සා/පෙ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් ඇතුළුව විෂයන් හයක් සමත්ව තිබීම.

සෑම අයදුම්කරුවකුම තනතුරට අදාල සියළු සුදුසුකම් අයදුම්පත් කැඳවන දිනයේ හෝ ඊට පෙර හෝ සම්පූර්න කර තිබීම අනිවාර්‍ය වේ.

5.0 ඉල්ලුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. සුදුසුකම් පරීක්ෂා කිරීමේදී යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවක ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කල හැකිය. අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගිය හොත් හෝ ඔහු / ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

6.0 පහත සඳහන් ආදර්ශ අකෘතියට අනුකූලව අයදුම්පත්‍රය ඉදිරිපත් කල යුතුය. ඊට අනුකූල නොවන හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නියි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය.

7.0 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහල කෙලවරේ "**තාවකාලික පදනම මත සනීපාරක්ෂක කම්කරු තනතුරකට බඳවා ගැනීම - ජනාධිපති ආරක්ෂක කොට්ටාසය**" යන්න සඳහන් කරන්න, අයදුම්පත්‍ර 2018.07.09 දිනට පෙර එවිය යුතුය.

8.0 මෙම නිවේදනයේ සඳහන් සුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියළු අයදුම්කරුවන් පොලිස්පති විසින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එහෙත් එසේ කැඳවීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළි ගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා මෙම නිවේදනය අනුව සුදුසුකම් තිබේ දැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

9.0 අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් එකක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කල යුතුය.

අ. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත.

ආ. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

10. සියළුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

අයදුම්පත් පහත ලිපිනයට එවිය යුතුය.

අධ්‍යක්ෂ
ජනාධිපති ආරක්ෂක කොට්ඨාසය
ජනාධිපති මාවත
කොළඹ 01

<u>තාවකාලික පදනම මත සනීපාරක්ෂක කම්කරු තනතුරට බඳවා ගැනීම.</u>

<u>ශ්‍රී ලංකා පොලිසිය ( ජනාධිපති ආරක්ෂක කොට්ඨාශය )</u>

01 මුලකුරු සමග නම :..........................................................................

02 සම්පූර්ණ නම :..........................................................................

03 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

04 ස්ථිර ලිපිනය : ..........................................................................

..........................................................................

05 ස්ත්‍රී පුරුෂ භාවය : ස්ත්‍රී ☐ පුරුෂ ☐

06 උපන් දිනය :..........................................................................

07 දුරකථන අංකය :..........................................................................

08 අධ්‍යාපන සුදුසුකම් :

අ.පො.ස ( සා.පෙළ ) විභාගය පිළිබඳ විස්තර

1. පළමුවර ප්‍රතිඵලය : වර්ෂය .............................. විභාග අංකය : ..............................

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

11. දෙවනවර ප්‍රතිඵලය: වර්ෂය .............................. විභාග අංකය : ..............................

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

09. ඔබ කවරදාක හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ?

ඔව් නැත

("ඔව්" නම් විස්තර සඳහන් කරන්න )

..............................................................................................................................

..............................................................................................................................

10. අයදුම්කරුගේ සහතිකය

අ. මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ / හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදු විය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද මෙහි සියළුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවද ප්‍රකාශ කර සිටිමි.

ආ. මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවද මම දනිමි.

ඇ. මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය : .............................................. ..............................................

අයදුම්කරුගේ අත්සන